# බුදුන් වහන්සේගේ තපෝ සංකල්පය

**ආචාර්ය වරාගොඩ ප්‍රේමරතන හිමි**
(පණ්ඩිත, බී. ඒ. (ගෞ) පී. එච්. ඩී.)

විද්‍යාමාන ඉන්දීය සාහිත්‍යයේ ආදිම අවදියේ සිට "තපෝ, තපස" යන වචන ව්‍යවහාරයෙහි පැවති නමුත් ඒවා දාර්ශනික හා ආගමික සංකල්ප බවට පත්වූයේ කවර වකවානුවකදැයි කීම දුෂ්කරය. ගිනි රස්නය, උෂ්ණය, කැපීම වැනි වාච්‍යාර්ථ යටපත් කොට ගෙන කලින් කල එහි ගෞණාර්ථ භාවිතයට පැමිණ බවට නම් සාධක දැක්විය හැක. මන්ත්‍ර මගින් යාග මගින්, නැත්-නම් ව්‍රත මගින් කෙනෙකු තුළ දියුණු කර ගන්නා අධ්‍යාත්මික ශක්තිය **තපෝ** යනුවෙන් නියෝජනය වනු පසුකලෙක දක්නට ලැබේ. ඍග්වේද යුගයේදීම, තපස නිර්මාණාත්මක බලයක් ලෙස හැඳින ගෙන තිබුණි. ඍතය හෙවත් විශ්ව පටිපාටිය නිර්මාණය කරනු ලැබු-වේත්, ආදී පුරුෂයා විසින් ලෝකය මැව්වේත් තපෝ බලයේ ආධාරයෙන් යැයි එකල විශ්වාසයක් තිබුණි. එමගින් භෞතික හා අධිභෞතික බලවේග මෙල්ල කළ හැකි බව ද පිළිගෙන තිබුණි. ඉන්ද්‍ර දෙවියන් දෙව්ලොව ජය ගත්තේ තපසේ අනුහසින් යැයි කියනු ලැබේ. යාගය සහ වෙනත් සංස්කාර ප්‍රතික්ෂේප කරන්නට පටන්ගත් ආරණ්‍යක යුගයේ සිට මිනිසා තපෝ බලය කෙරෙහි වඩ වඩාත් විශ්වාසය තබන්නට විය. පාලනය කළ නොහැකි භෞතික බලවේගයක් යාතිකා මගින් තමන්ට අවනත කර ගැනීම වෙනුවට තමන් තුළම යම් යම් ශක්ති විශේෂ ප්‍රගුණ කර ගැනීම මගින් ලොව ජය ගැනීම කෙරෙහි මිනිසාගේ සිත නැඹුරු වූයේ මෙතැන් සිටය. උපනිෂද් යුගයේදී තපස ලෝකෝත්තර තත්ත්වයක් කරා ළඟාවීමේ පරමාර්ථයෙන් වනගත ව ගෙවන ජීවිතයේ අවශ්‍යතම අංගයක් බවට පත්වනු දක්නට ලැබේ. 1. විවිධ ශාස්තෘ-වරුන්ගේ අළුත් අළුත් අර්ථකථන මගින් තපෝ සංකල්පය සංකීර්ණ ස්වරූපයක් ගත්තේ ඉන්පසුවය. බුද්ධ කාලය වන විට **කයට දුක්දීම** 2. තපස වශයෙන් පිළිගෙන තිබුණු බවට සූත්‍ර පිටකයෙන් සාධක ලැබේ.

බුදු සමයේ තපෝ සංකල්පය පිළිබඳව අප තුළ කුතුක පහළ වන්නේ බුද්ධ කාලයේ ම විසූ ඇතැම් තවු-සන් සහ වර්තමාන යුගයට අයත් සමහර උගතුන් දක්වන අදහස් හේතු කොට ගෙනය.

දීඝ නිකායේ කස්සප - සීහනාද සූත්‍රය මෙහිදී අපේ කුතුහලය අවුස්සාලන එක් මූලාශ්‍රයකි. "රෙදි නොහඳින්" (අචෙල) යන විශේෂණයෙන් හැඳින්වෙන හෙයින් මහා වීරතුමාගේ හෝ කර්කශ තපස් අගය කළ වෙනත් ශාස්තෘවරයෙකුගේ අනුගාමිකයෙකැයි සිතිය හැකි කස්-සප නම් තවුසෙක් බුදුන් වහන්සේ වෙත පැමිණ නැගු ප්‍රශ්නයක් ඒ සූත්‍රයේ සඳහන් වන්නේ මෙසේය.

> "ශ්‍රමණ ගෞතමයෝ සියලුම තවුස්වත් ගරහති. කර්කශ තවුස්වත් රකින සියලුම තවුසන්ට දොස් නගති; අපහාස කරති. මෙසේ කියන්නෝ භගවත් ගෞතමයන්ට සත්‍යය කණපිට පෙරලා අපහාස නොකරන්නෝ ද? ගෞතමයන් වහන්සේ දෙසන ධර්මය ඒ ලෙසින්ම ප්‍රකාශ කරන්නෝ ද?"

බුදුන්වහන්සේ තවුස්වත් හෙළා දුටු කෙනෙකු ලෙස එකල සිටි සමහරුන් අතර පිළිගැනීමක් තිබුණු බවට මේ ප්‍රශ්නයම නිදසුනකි. එහෙත් ඒ පිළිගැනීම තිබුණේ තවුසන් අතර ම ද යන්න ඉන් පැහැදිලි නොවේ. ඒ සම්බන්ධයෙන් දැක්විය හැකි හොඳම නිදසුන, දම්සක් පැවතුම සඳහා බරාණසියට වැඩම කළ තථාගතයන් වහන්සේ ඈත තියාම දුටු පස්වග තවුසන් අතර ඇති වන කතිකාවතයි. ඒ මෙසේ ය:

> "මේ එන ශ්‍රමණ ගෞතමයෝ භවභෝග ඇති කෙනෙකි. (බාහුලිකො) බවුන් වැඩීමේ අධිෂ්ඨානය අතහැර දමා බාහුලිකත්වයට නැඹුරු වූවෙකි. එහෙයින් අප විසින් ඔහුට නොවැඳිය යුතුය. ළඟාවන විට අසුන්වලින් නොනැගිටිය යුතුය. ඔහුගේ පා-සිවුරු නොපිළිගත යුතුය."

මේ කතිකාවතට හේතු වූයේ සිද්ධාර්ථ ගෞතමයන් කලින් පස්වග මහණුන් සමග එක්ව තවුස්දම් පිරීමය. ඒ පැරණි පිළිවෙත් ඉවත දැමීම පස්වග මහණුන්ගේ අවමානයට හේතු විය. බුදුන්වහන්සේ තවුස්දම් හෙළා දකින්නෙකැයි එකල සිටි යම් යම් තවුසන් විසින් පිළිගෙන තිබුණු බව මෙයින් තහවුරු වෙයි. සමහර නූතන උගත්තු මීට ඉඳුරාම වෙනස් අදහස් පළ කරති. බෞද්ධ සාහිත්‍යය පිළිබඳ හසළ යුරෝපීය පඬිවරයෙක් වූ ඊ. ජේ. තෝමස්ගේ කල්පනාවට අනුව, බුදු සමය පහළ වූයේම තවුස්වාදයක් ලෙසිනි. භික්ෂූන් අතර ප්‍රගුණ කළ කෙලෙස් ධූතාංග ඔහුට පෙනුණේ කර්කශ තපෝව්‍රත වශයෙනි. දරිද්‍රතාවය, අනගාරිකත්වය, බ්‍රහ්මචර්යය, හුදෙකලා බව, අවිහිංසාව ආදිය බෞද්ධ ආරාමික ජීවිතයේ ලක්ෂණ වශයෙන් දකින ලාල්මනි ජෝෂි ආදී බුදු සමය තවුස්දහමක් ලෙස සලකයි. බෞද්ධ ගිහියාගේ වුවත් ජීවන ප්‍රතිපදාව තවුස්වත් රැකීමක් ලෙස චාර්ලස් එලියට් කල්පනා කරයි.

උද්ධෘත කළ දෙවන මතය දරන උගතුන් කතා කරන්නේ මූලික වශයෙන් බුදු සසුනේ පැවිදි ජීවිතය ගැන විය යුතුය. තපස බුදුන්වහන්සේට සහ භික්ෂු ජීවිතයට සම්බන්ධ කොට දැක්වෙන සාක්ෂි කිහිපයක් සූත්‍ර පිටකයේ තැනින් තැන දක්නට ඇත. තපස හා

3. මු.ස. 861064

බ්‍රහ්මචර්යාව අභිකාරී කරුණු ලෙස මංගල සූත්‍රයෙහි සඳහන් වේ. සමගි සම්පන්න සංඝයා අතර පවතින තපස සුව එළවන සුළු යැයි ධම්ම පදය කියයි. තපස බුදුන්වහන්සේගේ ප්‍රශංසාවට ලක්වූ බව සංයුක්ත නිකායේ මාර සංයුතයෙන් පළවේ. බුදුන්වහන්සේ, තපස්වී කෙනෙකු ලෙස හැඳින්වීම එක් අතකින් නිවරද යැයි කියවෙන පාඨයක් අංගුත්තර නිකායෙහි හමුවේ. සමහර විට, මෙවැනි නිදසුන් ඉහත උපුටා දක්වන ලද මතවලට පදනම් වූවා විය හැක.

විවාදයකට යොමු කළ හැකි, යට දක්වන ලද මත වලින් කුමක් නිවැරදි ද යන්නත්, බුදුන්වහන්සේ විසිනුත්, සමකාලීන පරිව්‍රාජකාරීන් විසිනුත් පිළිගෙන තිබුණේ එක්බඳු තපෝ සංකල්පයක් ද යන්නත් සූත්‍ර පිටකය ඇසුරින් විමසා බැලීමට දැන් වෑයම් කරමු.

අපගේ විමශීනයට ලක් වූ මතවලින් තපසත්, බුදු සසුනෝ පැවිද්දත් එකක්මය යන අදහස පළ වෙතැයි පෙනෙන හෙයින් සූත්‍ර පිටකයේ ගිහිකම හා පැවිද්ද අගය කෙරෙන්නේ කෙසේදැයි මුලින් සොයා බැලිය යුතුවේ. විද්‍යාව හා ශිල්පීය ක්‍රම බෙහෙවින් දියුණු වී ඇති අද මෙන් ක්‍රි: පූ: 6 වැනි සියවසේ ඉන්දියාවේ ජීවිතය ආශ්වාදජනක වී යැයි හෝ සංකීර්ණ වී යැයි සිතිය නොහැක. කෙළවරක් නැති අවශ්‍යතා කරණකොටගෙන වත්මාන ලෝකයේ කොතැනක වුවත් මිනිස් ජීවිතය අනේකස්වරූපී අසහනයට යට වී ඇත. ඒ එසේ වුවත් පවතින සම්පත් උපරිම වශයෙන් භුක්ති විඳීමටත්, නව්‍ය - නව්‍ය සම්පත් සොයා ගැනීමටත් දරන උත්සාහය අද මෙන්ම එදත් මිනිස් ජීවිතයේ විශේෂතම ලක්‍ෂණය වූවාට සැක නැත. එකල මිනිසාගේ කායර්‍ය හා අභිලාෂය වූයේ කම් සැප සෙවීම සහ භුක්ති විඳීමය. බුදුන් වහන්සේ වෙත පැමිණි ගිහියෝ මෙ බව පැහැදිලි වචනයෙන් ප්‍රකාශ කළහ. මේ එකම කාරණය හේතුකොට ගෙන ගිහි ගෙයි අතහැර යාමට මූලික වශයෙන් බාධාවක් වූයේ ද කම්භෝගීත්වයයි. කාම සම්පත්තියෙහිම ඇලී ගැලී ඊට ම ගොදුරු වී එයින්ම මුසපත් වී සිටින අපට ගිහිගෙයින් නික්ම යාම මහා ප්‍රපාතයකට ඇද වැටීමක් බඳු යයි" තපස්සු තෙමේ ආනන්ද හිමියන්ට කීවේය. නමුත් පැවිද්දට යන්නන්ගේ අදහස වූයේ ගිහිගෙය නොයෙක් කම්කටොලු වලින් ගහණ වූ, කෙළෙසුන්ට ආකාරයක් වන බවයි.

බුද්ධ ධර්මයේ ස්වභාවයම කාමභෝගීන්ට නුරුස්සන්නක් බව සූත්‍ර පිටකයෙන් ම ප්‍රකාශ වෙයි. බුදු වීමෙන් පසු පස්වැනි සතියේ අජපල් නුගරුක මුල සමාපත්ති සුවයෙන් වැඩ සිටි තථාගතයන් වහන්සේ තුළ පහළ වූ සිතිවිල්ල ම මීට නිදසුනකි.

> "මා විසින් වටහා ගත් ධර්මය සියුම්ය. ගැඹුරුය. (එහි සත්‍යය) දැකීම අසීරුය. එය උඩු ගං බලා පීනා යාමකට සමානය. (පටිසෝතගාමී) රාගයෙන් මත් වී ගියවුන්ට, අවිද්‍යා අන්ධකාරයෙන් වැසී ගියවුන්ට ඒ ධර්මය වටහා ගැනීම දුෂ්කරය."

බුද්ධ ධර්මය උඩු ගං බලා පීනා යාමකට සමාන කොට මෙහි දැක්වේ. ඒ කුමක් නිසාද? අංගුත්තර නිකායේ භණ්ඩගාම වග්ගයේ පෙන්වා දී ඇති පුද්ගල භේදය මෙහිදී අපට උපකාර වෙයි. කෙනෙකුගේ සිත් හසර දෙස බලන විට පුද්ගලයන් වර්ග හතරකට බෙදෙන බව කියවෙන එහි එක් පුද්ගල වර්ගයක් "අනුසොතගාමී" යනුවෙනුත් තවත් වර්ගයක් "පටිසොතගාමී" යනුවෙනුත් හැඳින්වෙයි. ඒ අතරින්, කාමයන් සේවනය කරමින් පව්කම්වල යෙදෙන්නේ **අනුසොතගාමී** පුද්ගලයාය. පව්කම්වලින් වැළකී ඉතා අකැමැත්තෙන් වුවත් බ්‍රහ්මචර්යාව පුරන්නේ **පටිසොතගාමී** පුද්ගලයාය. පුද්ගලයන් දෙදෙනා අතර පවතින පරතරය මේ නිරුක්තියෙන් ප්‍රකට වෙයි. ස්වභාවික වශයෙන් කෙනෙකු තුළ පහළ වන ආශාවන් හා අපේක්‍ෂාවන් උත්සාහයෙන් නමුත් මර්දනය කොට ලෝකය ජය ගැනීමට දරන වෑයම පටිසොතගාමී ප්‍රතිපදාව ලෙස මෙයින් වැටහේ. පටිසොතගාමී යනු සංකේතාර්ථ පළ කරන වචනයකි. ජල ප්‍රවාහයක ප්‍රකෘති ස්වභාවය උස් බිමක සිට නිම්නයක් කරා ගලා යාමය. ඒ නිසා ගඟක ඉහළ සිට පහළ බලා ගමන් කිරීම (අනුසෝතගාමී) දුෂ්කර කාර්‍යයක් නොවේ. නමුත් පහළ සිට ඉහළට පීනා යාම (පටිසෝතගාමී) දුෂ්කර කාර්යයක් වන්නේ පීනන තැනැත්තා විසින්, රළ පහරෙහි වේගය සමඟ පොර බැදිය යුතු වන හෙයිනි. එය ප්‍රකෘති ස්වභාවය සමග කරන සටනකි. බුද්ධ ධර්මයේ ස්වභාවය ද එබඳුය.

අනිත් අතට, පැවිද්ද විස්තර කෙරෙන්නේ ගෙදරින් ඉවත් වී ගෙදරක් අහිමි තත්ත්වයකට පත්වීමක් ලෙසිනි. "ගෙදර" යනුවෙන් මේ අදහස් කරන්නේ පවුල හා ඊට අනුබද්ධ සම්පතුත්ය. පුද්ගලයන් පැවිද්දට පෙළඹවීම නිසා පවුල් කඩාකප්පල් කරන්නෙකු වශයෙන් බුදුන් වහන්සේ චෝදනා ලැබූ බව අපි දනිමු. පවුලත් ඒ හා බැඳී පවතින උපභෝග පරිභෝග වස්තු සියල්ලක් අතහැර වල් වැදීම පැවිද්ද ලෙසින් පිළිගෙන තිබුණේ බුදුන් වහන්සේ පහළ වන්නට කලිනි. සිදුහත් කුමරුන් මහබිනික්මන් කළේ තමන්ට පිය පරපුරෙන් උරුම වන්නට තිබුණු රාජ්‍යය පවා ප්‍රතික්ෂේප කරමිනි. සම්බාධ රහිත අජටාකාශය මෙන් පැවිද්ද නිදහස් බව බෞද්ධ සාහිත්‍යයෙහි විස්තර කෙරෙයි. භික්ෂුව තැනින් තැනට යන්නේ ගසකින් ගසකට පියඹා යන කුරුල්ලෙකු මෙන් බැඳීම් වලින් තොරවය.

පැවිද්ද විමුක්තියකට මඟක් නම්, ඒ මඟ ගැනීමේ අවශ්‍යතාවය පැන නගින්නේ කොහෙන්ද? බුදු දහම විසින් ඊට ඉතා පැහැදිලි පිළිතුරක් සොයා ගෙන තිබේ. දාර්ශනික වශයෙන් මෙන් ම ප්‍රායෝගික වශයෙන් විග්‍රහ කර බලන කල, ජීවිතය පෙනෙන තරමටම ආශ්වාදජනක නොවන බව පළමු ආයර්‍ය සත්‍යයෙන් පැහැදිලි කෙරෙයි. දුක් - දොම්නස්, කම්-කටොලු සියල්ලට මූලික වන්නේ තෘෂ්ණාව ප්‍රමුඛ කොට ගත් කෙළෙසුන් බව දෙවැනි ආයර්‍ය සත්‍යයෙන් පෙන්නුම් කෙරෙයි. කුසලාකුසල හැම ක්‍රියාවකටම මිනිසාගේ සිත යෙදෙන්නේ නොසංසිඳෙන අතෘප්තිකර ආශාව නිසාය. එහෙයින්, දුක් කෙළවර කර ගැනීම සඳහා කෙළෙසුන් සහමුලින් ම තුරන් කළ යුතු බව තෙවැනි ආයර්‍ය සත්‍යයෙන් පැවසෙයි.

නිර්වාණය හෙවත් සසරින් මිදීම කෙළෙසුන් ගෙවා දැමීම ලෙස නම් කෙරෙන්නේ එහෙයිනි. ආයර්‍ය අෂ්ටාංගික මාර්‍ගය සකස් කර ඇත්තේ අනුක්‍රමයෙන් කෙළෙස් ගෙවීමට පහසු වන ආකාරයෙනි.

නෛෂ්ක්‍රම්‍යය හෙවත් ගිහි ගෙයින් නික්ම යාම බෞද්ධ ආචාර විද්‍යාවේ ඉතාම වැදගත් අංගයක් බවට පත්ව තිබෙන්නේ ඇයි දැයි ඉහත දක්වන ලද විස්තරයෙන් පෙනෙයි. කාමයෙහි ආදීනව නොදැන - කාමයන් එපා නොවී, කෙනෙකුගේ සිත නෛෂ්ක්‍රම්‍යය කෙරෙහි නැඹුරු කළ නොහැක. මජ්ක්ධිම නිකායේ දන්තභූමි සූත්‍රයෙහි එන ජයසේන නම් රජකුමරු මීට කදිම නිදසුනකි. අචිරවත නම් සමනුද්දේසකයා වෙත ජයසේන රජකුමරු පැමිණියේ "නොපමා වන, වීයඹීවන්ත, භාවනාවට යොමු කළ සිත් ඇති භික්ෂුව සිතේ එකඟත්වය අනුභව කරයි ද?" යන ප්‍රශ්නයට පිළිතුරු සෙවීම පිණිසය. ධර්මය පිළිබඳ ගැඹුරු වැටහීමක් නොතිබුණු නමුත් කුමරුගේ ඇවිටිල්ල නිසා ම අචිරවත ප්‍රශ්නයට කෙටියෙන් පිළිතුරු දුන්නේය. එහෙත් රජ කුමරුගේ අදහස - එනම් පැවිදිවනට යො වූ තැනැත්තා සිතේ එකඟත්වයක් අනුභව නො කරයි යන්න - වෙනස් නොවීය. මේ සිද්ධිය සම්බන්ධයෙන් බුදුන් වහන්සේ දුන් පිළිතුරු මෙසේ විය.

"එය කෙසේ විය හැක්කක් ද ? නෛෂ්ක්‍රම්‍යය තුළින් දත යුතු වූ, ලබා ගත යුතු වූ, සාක්ෂාත් කර ගත යුතු වූ යමක් වෙයි නම්, එය කාමයන් මැද ජීවත් වන කාමයන් අනුභව කරන, කාම සිතුවිල්ලෙන් බර වී සිටින, කාම ගින්නෙන් දැවෙන කම්සැප කෙරෙහි ගිජු වූ ජයසේන කුමරුට කෙසේ වැටහේද? එය විය නොහැක්කකි."

මේ සියලු නිදසුන් වලින් පළ වන්නේ බුදුසමය ගිහි ජීවිතයට වඩා පැවිදි ජීවිතය අගය කරන බවයි. කම්සැප සෙවීම නොව ඒවා ප්‍රතික්ෂේප කිරීම උසස් කොට සැලකෙන බවයි. මෙම ආකල්පය තපෝවාදය අනුමත කිරීමක් ලෙස, ඒ නිසා කෙනෙකුට තර්ක කළ හැකිය. එසේ නම්, බුදුන්වහන්සේ තවුස්වත් හෙළා දකින්නෙකු ලෙස සමහර තවුසන් විසින් හඳුන්වන ලද්දේ කවර හේතුවක් නිසාද ?

කස්සප - සීහනාද සූත්‍රයෙහි දී කස්සපයන් විසින් නැගූ ප්‍රශ්නයට තථාගතයන් වහන්සේ දුන් පිළිතුරු ගැන සලකා බලමු. ඒ මෙසේය :

"කර්කශ තවුස්වත් රැකි සමහර තවුසන් මරණින් මතු අපායෙහි උපදින සැටිත්, සමහරුන් ස්වර්ගයෙහි උපදින සැටිත්, ලිහිල් තවුස්වත් රැකි සමහර තවුසන් අපායෙහි උපදින සැටිත්, සමහරුන් ස්වර්ගයෙහි උපදින සැටිත් මම මගේ මිනිස් බව ඉක්මවා ගිය පිරිසිදු දිවැසින් දුටුවෙමි. මෙලෙස ඒ ඒ තවුසන්ගේ යාම්, ඊම්, චුතවීම් ඉපදීම් මනා සේ දන්නා මම සියලු තවුස් දහම් හෝ කටුක තවුස්වත් රකින සියල්ලන්ට කුමට ගරහම්ද ?"

බුදුන් වහන්සේගේ පිළිතුරු මෙතෙකින් අවසන් නොවෙයි.

"පණ්ඩිත වූ නැණවත් වූ, නියුණු බුද්ධි ඇත්තා වූ ප්‍රඥා සහගත දෘෂ්ටි දරන්නා වූ ශ්‍රමණයෝ බ්‍රාහ්මණයෝ සිටිති. ඔවුන්ගේ සමහර අදහස් වලට මම එකඟ වෙමි. සමහර අදහස් වලට එකඟ නොවෙමි. ඔවුන් හොඳයි කියන සමහර දහම් හොඳයි කියා මමත් කියමි. ඔවුන් නරකයි කියන සමහර දහම් නරකයි කියා මමත් කියමි. ඔවුන් නරකයි කියන සමහර දහම් හොඳයි කියා මම කියමි. ඔවුන් හොඳයි කියන සමහර දහම් නරකයි කියා මම කියමි."

සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේගේ තපස සම්බන්ධයෙන් කොතරම් විචාරපූර්වක වී දැයි සිතා ගන්නට මේ පිළිතුරු ප්‍රමාණවත්ය. තපස කෙරෙහි උන්වහන්සේ හෙලූ දෘෂ්ටිය ගතානුගතික යැයි හෝ ඒකාංගික වූවකැයි හෝ සංශයවාදී වූවකැයි හෝ නාස්තික වූවකැයි මේ අනුව කිය නොහැක. තපසේ කර්කශ බවට හෝ ලිහිල් බවට පැසසීමක් හෝ ගැරහීමක් මෙහි නැත. සියලු තවුස් දහම් එකහෙළා ප්‍රතික්ෂේප කිරීමක් හෝ පිළිගැනීමකුදු මෙහි නැත. ආචීර්ණ කල්පික තවුස්වත් - සර්වතොභද්‍ර හෝ සර්වතො අභද්‍ර - හැමතින්ම යහපත් හෝ හැමතින්ම අයහපත් නොවන බව ඉන් ගම්‍ය වෙයි.

මේ පිළිතුරෙන් පසු, එකල භාවිතයේ පැවති තවුස්වත් මාලාවක් ඉදිරිපත් කළ කස්සප තවුසා ඒවා මහණකම ලෙස සමහරුන් ප්‍රකාශ කරන බව කීවේය. ඒ අදහස නොපිළිගත් ගෞතමයන් වහන්සේ කෙනෙකු තුළ සීල සම්පත්තියත්, චිත්ත සම්පත්තියත් දියුණු වී නැත්නම් හෙතෙමේ මහණකමේ හෝ බමුණුකමේ අසළකටවත් ළං වී නැත්තෙකැයි අවධාරණයෙන් කියා සිටියහ. තවුස්වතත්, පැවිදිවතත් අතර කොතරම් පරතරයක් ඇද්ද යන්නත් මෙයින් ම පැහැදිලි වෙයි. මේ නිගමනය වඩාත් අර්ථවත් කරනු පිණිස බුදුන් වහන්සේ බමුණුකම හා මහණකම යනු කුමක්දැයි පහත දක්වෙන අයුරින් තවදුරටත් පැහැදිලි කළහ :

"යමෙක් වෛරයෙන් හා ක්‍රෝධයෙන් තොරව මෙත් සිත වඩාද, ආශ්‍රව ගෙවා දැමීමෙන්" පිරිසිදු වූ චිත්ත විමුක්තියක්, ප්‍රඥා විමුක්තියක් තමා විසින්ම අවබෝධ කොට ගෙන සාක්ෂාත් කොට ගෙන වාසය කරයි ද හෙතෙම ශ්‍රමණයෙකි, බමුණෙකි.

තවුසා විසින් විස්තර කළ තවුස්වත් ගිහියෙකු විසින් හෝ කුලියට දිය අදින දාසියක විසින් වූවත් රැකිය හැකි බව ද උන්වහන්සේ කියා සිටියහ.

සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ තුළ තපස කෙරෙහි යථාර්ථවාදී සහ විභජ්ජවාදී ආකල්පයක් ගොඩ නැගුණේ තමන්ගේම පර්යේෂණ සහ අත්හදා බැලීම් මගින් බවට මහාසීහනාද සූත්‍රයත් අරියපරියෙසන සූත්‍රයත් සාක්ෂි දරයි. තථාගතයන් වහන්සේ දහම් දෙසන්නේ එතුමන් තුළ ලොව්තුරා දහම් සහ සුවිශේෂ ඥාණයක් ඇති නිසා නොව තර්ක කිරීමේ හැකියාව පදනම් කොට ගෙන යැයි සුනක්ඛත්ත විසින් කළ අපහාසාත්මක ප්‍රකාශනයට පිළිතුරු වශයෙන් තමන් විසින් කිංකුසල ගවේසියෙකු වශයෙන් කළ අත්හදා බැලීම් ගැන සීහනාද සූත්‍රයේ දී උන්වහන්සේ සැකෙවින් විස්තර කළහ. කපිල වස්තු පුරයෙන් පිටත් වූ බෝසතාණෝ උරුවෙල දනව්වට එන තෙක් ගත සාවුරුදු කාලය තුළදී සිරුරට දුක් දෙමින් උග්‍ර, කර්කශ, හැඩි දැඩි තවුස්වත පුරමින් චතුරංග සමන්නාගත බ්‍රහ්මචර්යාව සම්පූර්ණ කිරීමට ගත් උත්සාහය ඒ විස්තරයට ඇතුළත් වේ. තපශ්චර්යාවේ අන්තයටම ගිය සිදුහත් තවුසාණෝ ඇඳුම් හා ආහාර සම්බන්ධයෙන් නොයෙක් සීමා පනවා ගත්හ. යාම් - ඊම්, ඉඳුම් - හිටුම් සහ ආසන - සේනාසන පිළිබඳව දැඩි සීමා පනවා ගත්හ. කුණෙන් දුහුවිල්ලෙන් අපවිත්‍ර වූ සිරුර අවුරුදු ගණනක් තිස්සේ පිරිසිදු නො කර, දියෙන් නො නහවා,

හම පුපුරු ගැහෙන තෙක් කටුකත්වයේ අන්තයට ගියහ. මනා සිහියෙන් යුතුව තණ අග එල්ලෙන පිනි බින්දුවකට වත් අනාදරයක් නොවන තරමට දයාපරවශව ජේගුචජීතාව පරම කෙළවරට ගෙන ගියහ. ගිරි කඳුරු වන ලැහැබ් ආදී තැන්වලට ගොස් මිනිස් රුවක් නොදැක මිනිස් කටහඬක් නොඅසා දවස ගෙවමින් සිව් පා සතුන්ගේ නැතහොත් තමන්ගේම මල - මූත්‍ර අනුභව කරමින් ඉතාම බිහිසුණු වනාන්තර වල සොහොන්වල දිවා රාත්‍රි ගෙවමින් ඒකාකාරීව විවේකචාරීත්වය ද අන්තයට ගෙන ගියහ. එතෙකින් නොනැවතුණු සිදුහත් තවුසාණෝ ආහාරය මගින් ශුද්ධිය ලැබීමේ අදහසින් එක කොළයක් පමණක් අහරට ගනිමින් සිරුර තනිකර ඇට සැකිල්ලක් බවට පත්වන තුරු කාලය ගත කළහ. තනිකර හාල් හෝ මුං ඇට කිහිපයක් ආහාරයට ගනිමින් දවස ගත කළහ. මේ ආදී වශයෙන් තමන් දන්නා හැම තවුස්වත්ම අකුරට ක්‍රියාත්මක කළහ. අන්තිමේ දී සිදුහත් තවුසාගේ ව්‍රතයන් කෙතෙක් දැඩි වී ද යතහොත් එතුමාගේ උදරයත් කොඳු ඇට පෙළත් එකට එක් විය. මේ සියල්ලෙහි ප්‍රතිඵලය කුමක් වී ද? බුදුන් වහන්සේගේ ම වචනයෙන් එය ප්‍රකාශ වන්නේ මෙසේ ය.

> "එම ඉරියව්වෙන් එම ප්‍රතිපදාවෙන්, එම දුෂ්කර ක්‍රියාවෙන් මිනිස් ස්වභාවය ඉක්මවා ගිය, ආර්යයන්ට ගැලපෙන විශේෂ දර්ශනයක් නොලදිමි. ඊට හේතු කිම? ආර්ය ප්‍රඥාව නො ලැබීමයි. මා විසින් ලබා ගත් ආර්ය ප්‍රඥාව ඊට අනුරූපව ක්‍රියා කරන්නා මනාසේ දුකින් මුදවා ලයි."

කායික වශයෙන් පීඩාකාරී වූ තවුස්වත් දුකින් මිදෙන මඟක් නොවන බව මෙයින් තහවුරු වෙයි. දීඝනිකායේ උදුම්බරික සිහනාද සූත්‍රය මේ අදහසම අංග සම්පූර්ණ ලෙස විස්තර කරන තැනකි. පරිව්‍රාජකයන් තුන්සිය දෙනෙකු පිරිවරා ගත් නිග්‍රෝධ නම් පරිව්‍රාජකයාත් සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේත් අතර පැවැති සාකච්ඡාවක් එහි වාර්තා වී තිබේ. තවුස්වතම වාදයක් කොට ගෙන, සාරයක් කොට ගෙන වසන පරිව්‍රාජකයෙකු සමග කෙරෙන මෙම සාකච්ඡාව අපට විශේෂයෙන් වැදගත් වෙයි. නිග්‍රෝධගේ උනන්දුව වූයේ තපස සම්පූර්ණ වන්නේ කෙසේද? යන්න දැන ගැනීමටය. සිරුරට දුක් දෙන සියලු තවුස් වත් පිරීමෙන් තපස සම්පූර්ණ වෙතැයි ඔහු පිළිගෙන සිටියේ ය. ඒ අදහස නොපිළිගත් බුදුන්වහන්සේ එම පිළිගැනීමේ අඩුපාඩුව දක්වනු පිණිස මෙසේ වදාළහ.

> "නිවාරක තපස සම්පූර්ණ කළ පසුත් (තවුසකුගේ සිත තුළ) නොයෙක් කෙලෙසුන් පවතින බව මම කියමි."

තමන් හුවා දැක්වීම අනුන් හෙළා දැකීම, ලාභ - සත්කාර - කීර්ති ආදියට ගිජුවීම ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, කෝපය ආදී මනෝභාව තපස අපිරිසිදු වීමට හේතුවන බව පෙන්වා දුන් බුදුහාමුදුරුවෝ එවැනි මනෝභාව සහ කෙලෙසුන් දුරු කිරීම සඳහා චතුයාම සංවරය මගින් කාය - වාක් මනෝ දුශ්චරිත මෙන්ම පංච නීවරණයන් සිතින් පහ කළ යුතු බවත් සතර බ්‍රහ්ම විහරණය ප්‍රගුණ කොට, පුබ්බේ නිවාසානුස්සතිය, දිබ්බ චක්ඛු, චුතූපපාත ඤාණ යන අතිමානුෂික ඤාණ විශේෂයන් උපදවා ගත යුතු බවත් පැහැදිලි කළහ.

ගතානුගතික වශයෙන් මෙතෙක් පැවති තපස පිළිබඳ නිරුක්තිය බුදුන් වහන්සේ විසින් අළුත් ආකාරයකින් විවරණය කරන අයුරු දැන් වටහා ගත හැකිය. නිඝණ්ඨනාථ පුත්ත තුමාගේ උපාසකයෙකු වූ සීහ නාද සේනාපතියා අමතන බුදුහාමුදුරුවෝ ඒ නිරුක්තිය සැකෙවින් දක්වන්නේ මෙසේ ය.

> "ශ්‍රමණ ගෞතමයෝ තපස්වී කෙනෙකි. තපස් වී බව උදෙසා දහම් දෙසන්නෙකි, යන කියමන එක් අතකින් නිවැරැදිය. පවට නැඹුරු වූ කාය දුශ්චරිත වාක් දුශ්චරිත සහ මනෝ දුශ්චරිත තැවිය යුතු (තපනීයා) යැයි මම කියමි."

තැවිය යුත්තේ කය නොව, කයින්, වචනයෙන් සහ සිතින් සිදුවන අකුසල ධර්ම බව මෙයින් අවධාරණය කෙරේ.

බෞද්ධ ආචාර විද්‍යාවේ ආකෘතිය ලෙස සැළකිය යුතු මධ්‍යම ප්‍රතිපදාව ගැන සඳහන් නොකරතොත් අපේ සාකච්ඡාව සම්පූර්ණ නොවේ. එම ප්‍රතිපදාව සොයා ගන්නට සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේට මග පෑදුනේ බුද්ධත්වයට පෙර උන්වහන්සේ තුළ පැවැති කිංකුසලගවේසී කුතුහලය තුළිනි. එය සත්‍ය වශයෙන්ම ක්‍රි: පූ: 6 වැනි සියවසේ තවුසන් අතර ව්‍යවහාරයෙහි පැවති අර්ථශූන්‍ය ව්‍රතයන් පිළිබඳ ගැඹුරු ප්‍රායෝගික පයේෂණයකින් පසු අනාගාරික පිළිවෙතේ අර්ථවත් සංස්කරණයක් කිරීමකි. සංයුක්ත නිකායේ ධම්මචක්කප්පවත්තන වග්ගයට ඇතුළත් කර ඇති බුදුන්වහන්සේගේ මංගල ධර්ම දේශනාවෙහි ඒ නැවුම් ප්‍රතිපදාව සැකෙවින් විවරණය වෙයි. ඉඳුරන් පිනවීමෙහි ඇලී - ගැලී සිටීම (කාමසුඛල්ලිකානු යෝගය) සහ කයට දුක්දීම (අත්තකිලමථානු යෝගය) යනුවෙන් අන්ත දෙකක් එහි දැක්වේ. එයින් මුල් අන්තය සාවද්‍ය යැයි සැලකෙන්නේ එය පහත් (හීනො) වූ, ගැමි පැවතුමක් (ගම්මො) සහ බොහෝ දෙනා අතර බහුල වශයෙන් පවතින්නක් (පොථුජ්ජනිකො) වන හෙයිනි. දෙවැනි අන්තයේ වරද එය පීඩාකාරී (දුක්ඛො) පිළිවෙතක් වීමයි. මේ දක්වා අප තවුසන් අතර භාවිත වූ වත් ලෙස ගෙන සාකච්ඡා කළේ මෙම අන්තය ගැනයි. ඒ ප්‍රතිපදා දෙකම උත්තමයන්ට අනුරූප නොවන්නක් (අනරියො) මෙන්ම හිත - සුව පිණිස නොපවතියි. (අනත්ථසංහිතො) එහෙයින් මේ අන්ත දෙකම පැවිද්දන් විසින් වර්ජනය කළ යුතු යැයි (පබ්බජිතෙන න සෙවිතබ්බා) බුදුන්වහන්සේ තරයේම කියා සිටිති. සිද්ධාර්ථ ගෞතමයන් පහළ වන විට, පැවිද්දන් ගමන් කරමින් සිටියේ මේ මාර්ග දෙකින් එකක බවත්, උන්වහන්සේ අළුත් පැවිදි පිළිවෙතක් සොයාගත් බවත් දැන් පැහැදිලි වේ.

කයට දුක්දීම තපස යැයි මේ දක්වා පැවති පිළිගැනීම බුදුන්වහන්සේ විසින් නිරස්ත කළ ආකාරය අප ඉහත දී දුටුවෙමු. බෞද්ධ මතයට අනුව සිතින්, කයින්, වචනයෙන් සිදු වන පව් තුරන් කිරීම තපස ලෙස බුදුන් වහන්සේ නිගමනය කළහ. මේ අනුව බලන විට, අපගේ සාකච්ඡාවට තුඩු දුන් මත දෙකම අර්ධ සත්‍යයන් බව කිය යුතුවේ.

# අධෝ ලිපි

1. **මුණ්ඩක** I III II, 3 1 5 ප්‍රශ්න 4.4.
(එස්. රාධාක්‍රිෂ්ණන්ගේ **Thirteen Principal Upanishads** නම් ග්‍රන්ථය ඇසුරෙනි. ලන්ඩන් මුද්‍රණය 1971)

2. "කායස්ස ආතාපන - පරිතාපනානුයොගමනුයුත්තො............ **දීඝනිකාය,**
සංස්කරණය: ටි. ඩබ්ලිව්. රීස් ඩේවිඩ්ස් සහ ජේ. ඊ. කාර්පෙන්ටර්, 1 වැනි කාණ්ඩය ලන්ඩන්, 1967, 78 පිට

3. දීඝ. 1 - 161 - 177 පිටු

4. "ස්මණො ගොතමො සබ්බං තපං ගරහති, සබ්බං තපස්සිං ලූඛාජීවිං එකංසෙන උපක්කොසති, උපවදතීති" කච්චි තෙ භො ගොතමස්ස වුත්තවාදිනො න ච භගවන්තං ගොතමං අභූතෙන අබ්භාචික්ඛන්ති ධම්මස්ස ච අනුධම්මං ව්‍යාකරොන්ති.........
දීඝ. 1 - 161 පිටුව

5. "අයං ආවුසො සමණො ගොතමො ආගච්ඡති, බාහුලිකො පධානවිබ්භන්තො ආවත්තො බාහුල්ලාය. සො නෙව අභිවාදෙතබ්බො න පච්චුට්ඨාතබ්බො නාස්ස පත්තචීවරං පටිග්ගහෙතබ්බං,
**මජ්ඣිම නිකාය,** සංස්කරණය: ව. ටෙන්ක්නර් 1 කාණ්ඩය ලන්ඩන් 1964, 171 පිට.

6. ඊ. ජේ. තෝමස්, **The History of Buddhist Thought** ලන්ඩන් 1953, 16 පිට

7. එල්. එම්. ජෝෂි, **Studies in Buddhist Culture in India,** 1967, 108 පිට

8. චාර්ල්ස් එලියට්, **Hinduism and Buddhism** 73 පිට

9. **සුත්තනිපාත,** නව සංස්කරණය ඩී. ඇන්ඩර්සන්, හෙල්මර් ස්මිත්, ලන්ඩන් 1965, 47 පිට

10. **ධම්මපද,** බුද්ධවග්ග, 16 වැනි ගාථාව

11. **සංයුත්තනිකාය,** සංස්කරණය එම්. ලියොන් පියර් 1 වැනි කාණ්ඩය, ලන්ඩන්, 1960, 103 පිට.

12. **අංගුත්තර නිකාය,** IV සංස්කරණය: මහාචාර්ය ඊ. හාඩි, IV වැනි කාණ්ඩය, ලන්ඩන් 1958, 184 පිට

13. **සංයුත්ත** 1. 74 පිට: අංගුත්තර IV 439 පිට

14. **අංගුත්තර** IV 438 පිට

15. "සම්බාධෝයං ඝරාවාසො රජාපථෝ (සූත්‍ර පිටකයේ නොයෙක් තැන හමුවේ.) බලන්න: **දීඝ** I 63 පිට **සංයුක්ත** II 219 පිට, **මජ්ඣිම නිකාය** සංස්කරණය: රොබර්ට් චාමස් III කාණ්ඩය ලන්ඩන් 1960, 33 පිට

16. "කිච්චෙන මෙ අධිගතං හලංදානි පකාසිතුං
රාගදොසපරෙතෙහි නායං ධම්මො සුසම්බුධො
පටිසොතගාමිං නිපුණං ගම්භීරං දුද්දසං අණුං
රාගරත්තා න දක්ඛින්ති තමොක්ඛන්ධෙන ආවටා
**සංයුත්ත** 1, 136 පිට

17. **අගුත්තර** II 5. පිට

18. " අගාරස්මා අනගාරියං පබ්බජති/පබ්බජී "

19. පහත දැක්වෙන උද්ධෘතපාඨය මීට සාක්ෂියකි.
" සො අපරෙන සමයෙන අප්පං වා
භොගක්ඛන්ධං පහාය
මහන්තං වා භොගක්ඛන්ධං පහාය අප්පං
ඤාතිපරිවට්ටං පහාය
මහන්තං වා ඤාතිපරිවට්ටං පහාය කෙසමස්සුං
ඔහාරෙත්වා
කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා
අනගාරියං පබ්බජති"
**මජ්ඣිම** 1, 179 පිට

20. "අබ්භොකාසෝයං පබ්බජ්ජා"

21. **සංයුත්ත** IV 421 පිටේ සිට

22. **මජ්ඣිම** III 128 - 137 පිටු

23. "තං කුතෙත්ථ අග්ගිවෙස්සන ලබ්භා?
යං තං නෙක්ඛම්මේවන
ඤාතබ්බං ......තුට්ඨබ්බං ...... පත්තබ්බං ......
සච්ඡිකාතබ්බං, තං වත
ජයසෙනො රාජකුමාරො කාමමජ්ඣෙ
වසනෙතා කාමෙ පරිභුඤ්ජනෙතා
කාම - විතක්කෙහි ඛජ්ජමානො
කාමපරිලාහෙන ඩය්හමානො
කාමපරියෙසනාය උස්සුක්කො ඤස්සති වා
දක්ඛති වා සච්ඡි වා
කරිස්සති ති නෙතං ඨානං විජ්ජති"
**මජ්ඣිම** III 129 - 130 පිටු.



4. මු.ස. 861064

24. "ඉධාහං කස්සප එකච්චං තපස්සිං
ලූඛාජීවිං පස්සාමි දිබ්බෙන
චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන
...... කායස්ස භෙදා
පරම්මරණා දුග්ගතිං ......උප්පන්නං
ඉධාහං කස්සප එකච්චං
තපස්සිං ලූඛාජීවිං ......සුගතිං ......
උප්පන්නං ඉධාහං ......
එකච්චං තපස්සිං අප්පදුක්ඛ
විහාරිං ...... දුග්ගතිං ......
උප්පන්නං : ඉධාහං ...... එකච්චං
තපස්සිං අප්පදුක්ඛ විහාරිං
සුගතිං සගගං ලොකං උප්පන්නං
යෝ හං කස්සප
ඉ මෙසං තපස්සිනං එවං ආගතිං ච
ගතිං ච චුතිං ච
උප්පත්තිං ච යථාභූතං පජානාමි
සෝහං කිං සබ්බං තපං
ගරහිස්සාමි සබ්බං තපස්සිං
ලූඛාජීවිං එකංසෙන
උපකොසාසිසිස්සාමි උපවදිස්සාමි.
සන්ති කස්සප එකෙ සමණ -
බ්‍රාහ්මණා පණ්ඩිතා නිපුණා
......තෙහි පි මෙ සද්ධිං
එකච්චෙසු ඨානෙසු සමෙති,
එකච්චෙසු ඨානෙසු න සමෙති.
යං වෙ එකච්චං
වදෙන්ති සාධූති, මයං පි තං
එකච්චං වදෙම සාධූති.
ධං තෙ එකච්චචං වදෙන්ති න සාධූති ......
මයං පි ...... නසාධූති ......
**දීඝ 1 161 - 162 පිටු**

25. **දීඝ 1. 167 පිට**

26. එම, 168 පිට

27. එම, 168 පිට

28. **මජ්ඣිම, 1, 68 - 83 පිටු**

29. එම, 160 - 175 පිටු

30. "නාය පි බො අහං ඉරියාය නාය
පටිපදාය නාය දුක්කරකාරිකාය
නාජ්ඣගමං උත්තරිං මනුස්සධම්මං
අලමරියඤාණදස්සනවිසෙසං
තං තිස්ස හෙතු? ඉමිස්සා යෙව
අරියාය පඤ්ඤාය අනධිගමා
යායං අරියා පඤ්ඤා අධිගතා අරියා
නියාානිකා නියාාති
තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයාය"
**මජ්ඣිම 1 . 81 පිට**

31. **දීඝ නිකාය,** සංස්කරණය ජේ. කාර්පෙන්ටර්
කාණ්ඩය, ලන්ඩන් 1960, 36 - 57 පිටු

32. "එවං පරිපුණ්ණගාය පි බො අහං නිග්‍රොධ තපො
ජිගුච්ඡාය අනෙකවිහිතෙ උපක්කිලෙසෙ වදාමි" එම
42 පිට.

33. "තපනීයාහං සීහ පාපකෙ අකුසලෙ ධම්මෙ වදාමි
කායදුච්චරිතං වචීදුච්චරිතං මනොදුච්චරිතං
**අංගුත්තර IV 184 පිටුව**

34. **සංයුක්ත V 421 පිටේ සිට**